**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**


පළමු වාර පරීක්ෂණය - 2018 | 11 ශ්‍රේණිය
இரண்டாம் தவணைப் பரீட்சை 2018 | தரம் 11
**First Term Test - 2018** | **Grade 11**

ගෘහ ආර්ථික විද්‍යාව 1
මனைப் பொருளியல் 1
Home Economic Science - 1

කාලය පැය 1
ஒரு மணித்தியாலம்
**One hour**

*සැලකිය යුතුයි:*

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.

1 උසින් අඩු ජනේලයකට ඉරි සහිත තිරරෙද්දක් දැමීමට සුදුසු වන්නේ

i ඉරි විකර්ණාකාරව සිටින ලෙසය
ii ඉරි තිරස්ව සිටින ලෙසට
iii ඉරි සිරස්ව සිටින ලෙසය
iv ඉරි තිරස්ව හා සිරස්ව සිටින ලෙසට

2 ප්‍රාථමික වර්ණ දෙකක් එක සමාන ප්‍රමාණවලින් මිශ්‍ර කිරීමේ දී ද්විතියික වර්ණ සෑදේ. ද්විතියික වර්ණ වනුයේ

i තැඹිලි, කොළ, දම් ii රතු තැඹිලි, නිල් දම්, කහ කොළ
iii රතු , තැඹිලි, කහ iv කහ, කොළ, නිල්

3 කිසියම් ස්ථානයක ප්‍රමුඛව පෙන්නුම් කරන ලක්ෂණයක් තුළින් පුද්ගලයෙකුගේ සිත ක්ෂණිකව ඇද ගන්නා ආකාරයට සකස් වීම

i එකඟත්වය ii අවධාරණයයි iii සමානුපාතය iv තුලනයයි

4 රේඛා එකතුවකින් හැදෙන්නේ

i හැඩයයි. ii තුලනයයි. ii රිද්මයයි. iv සමානුපාතයයි.

5 න්‍යෂ්ටික පවුලක සාමාජිකයන් වනුයේ

i දෙමව්පියන්, ඥාතීන් හා දරුවන්ය. ii දෙමව්පියන් හා විවාහක දරුවන්ය.
iii දෙමව්පියන් හා දරුවන්ය. iv දෙමව්පියන්, විවාහක දරුවන් හා ඥාතීන්ය.

6 ඉඩකඩ පිරිමසන ගෘහ භාණ්ඩ වනුයේ

i හකුලන ඇඳුම් රාක්ක හා ඩිවානය
ii ලාච්චු සහිත ඇඳන් හා අල්මාරිය
iii බිත්ති අල්මාරි හා හකුලන ඇඳන් ය.
iv ඩිවානය හා හකුලන ඇඳන් ය.

7 නිවෙස් තුළට ස්වභාවික ආලෝකය හා වාතාශ්‍රය ලබාදීමෙන් ඇතිවන වාසියක් නොවන්නේ

i නිවෙස තුළ සුව පහසුව ii ක්ෂුද්‍ර ජීවී වර්ධනය අවමවීම
iii නිවෙස තුළ අලංකාරය හා ක්‍රමානුකූල බව iv විදුලි බිල අඩුවීම

8 පවුලේ අවශ්‍යතා සපුරාලීමේ දී මානසික අවශ්‍යතාවන් ලෙස සැළකෙන්නේ

i කරුණාව ii සහයෝගය iii අධ්‍යාපනය iv රැකවරණය

9 මුඛයේදී නිපදවෙන එන්සයිමය වනුයේ

i ටයලින් ii ට්‍රිප්සීන් iii ලයිපේස් iv රෙනින්

10 ආමාශික යුෂෙහි අඩංගු වන අම්ලය වනුයේ

i හයිඩ්‍රොක්ලෝරික් අම්ලය ii නයිට්‍රික් අම්ලය
iii සල්පියුරික් අම්ලය iv ඇස්ට්‍රික් අම්ලය

11 ඉන්සියුලින් හෝමෝනය ශ්‍රාවය කරනු ලබන්නේ

i ආමාශයෙනි ii පිත්තාශයෙනි
iii අග්න්‍යාසයෙනි iv ග්‍රහණියෙනි

12 කාබෝහයිඩ්‍රේට් ජීර්ණයේ අවසාන ඵලය වන්නේ

i මේද අම්ලය. ii ඇමයිනෝ අම්ලය. iii ග්ලූකෝස්. iv සුක්රෝස්.

13 ප්‍රෝටීන් ජීර්ණය ආරම්භ වන්නේ

i මුඛයේදී ය ii ආමාශයේදී ය iii ග්‍රහණියේදී ය iv කුඩා අන්ත්‍රයේදී ය

14 ආහාර ජීර්ණයේ දී යාන්ත්‍රික සාධකයන් පමණක් ක්‍රියාත්මක වී ආහාර ගමන් කිරීම සිදුවන්නේ

i අක්මාව තුළිනි ii පිත්තාශය තුළිනි
iii අන්නසෝත්‍ර තුළිනි iv ග්‍රහණිය තුළිනි

15 ළදරුවෙකු ඉපදී පළමු මාස 5 අවසානයේ දී බර උපත් බර මෙන්

i දෙගුණයක් වේ ii තුන් ගුණයක් වේ
iii සිව් ගුණයක් වේ iv පස් ගුණයක් වේ

16 ප්‍රති ඔක්සිකාරක ලෙස ක්‍රියාකරන විටමින් වන්නේ

i විටමින් A,B,D ii විටමින් A,C,E
iii විටමින් A,D,K iv විටමින් A,B,C

17 මේද ද්‍රව්‍ය විටමින් වන්නේ

i B හා C ය. ii A,B හා C ය.
iii A,D,E,K ය iv B,D,E,K ය

18 මාළු අක්මා තෙල්වල අඩංගු වේ. හෘද රෝගීන්ට සුදුසු වේ.

i කැප්රිටික් අම්ලය ii ලෝරික් අම්ලය
iii බියුට්‍රික් අම්ලය iv ඔමේගා 3 අම්ලය

19 සත්ව පිෂ්ඨය ලෙස හඳුන් වන්නේ

i ග්ලයිකොජන්ය ii ඉනියුලින්ය iii සෙලියුලෝස් ය iv පෙක්ටීන්ය

20 පටක ක්‍ෂයවීමේ වේගය වැඩි නිසා සිරුරේ පැවැත්මට ප්‍රෝටීන අවශ්‍යවේ. මල බද්ධය වැලැක්වීම සඳහා ප්‍රමාණවත් තන්තු සහිත ආහාර හා ජලය ලබා දිය යුතුය. ඉහත සඳහන් වන්නේ කුමන අවධියේ පෝෂණ අවශ්‍යතා පිළිබඳවද

i ක්‍ෂීරණ අවධිය ii ගර්භණී අවධිය
iii මහළු අවධිය iv යෞවන අවධිය

21 පිටිමෝලි ආහාර සකස්කිරීමේ දී තිරිඟු පිටි භාවිතා කිරීම වඩාත් යෝග්‍ය වන්නේ එහි අඩංගු

i ග්ලූටන් ii ඩෙක්ස්ට්‍රීන්

iii ජෙලටීන් iv සෙලියුලෝස් නිසාය

22 ශාක ආහාර මගින් ලබාදෙන විටමින් A හඳුන්වනුයේ

i රෙටිනෝල් ලෙසය ii බීටා කැරොටීන් ලෙසය

iii තයමින් ලෙසය iv ෆෝලික් අම්ල ලෙසය

23 අස්ථි විකෘතිතාව, බෙරි බෙරියාව, ශීතාද පෙලාග්‍රා යන ඌණතා රෝග කෙරෙහි බලපාන විටමින් පිළිවෙලින්

i විටමින් A, විටමින් D , විටමින් B, විටමින් C ය

ii විටමින් B, විටමින් C , විටමින් D, විටමින් A ය

iii විටමින් D, විටමින් B-1 , විටමින් C, විටමින් $C_3$ ය

iv විටමින් C, විටමින් D , විටමින් B, විටමින් A ය

24 කෝලිකැල්සිෆෙරෝල් හා ටොකොෆෙරෝල් ලෙස හඳුන්වන විටමින හඳුන්වන්නේ

i විටමින් A සහ C ය ii විටමින් B සහ D ය

iii විටමින් D සහ E ය iv විටමින් A සහ Dය

25 ආහාරයේ ගුණාත්මක බව රැක ගැනීම සඳහා ආහාර ගබඩා කිරීමේ දී අනුගමනය කරනු ලබන නිවැරදි ක්‍රමය වන්නේ

i මාළු සෝදා කොටස්කර අසුරා අධි ශීතකරණයේ තැබීම.

ii එළවලු සෝදා දොරේ තැන්පත් කිරීම

iii පළතුරු යුෂ බෝතල් කර අධි ශීතකරණයේ තැබීම.

iv එළවලු වර්ග සෝදා ශීතකරණයේ ඉහල තැබීම.

26 විනිවිද පෙනෙන ඕගන්ඩි වැනි රෙද්දක නොපිටින් මැසීමට වඩාත් සුදුසු වන සේයා / සෙවනැලි මැස්ම නමින් හඳුන්වන විසිතුරු මැහුම් ක්‍රමය කුමක්ද?

i සැටින් මැස්ම ii කතිර මැස්ම iii හුරුළු කටු මැස්ම iv දම්වැල් මැස්ම

27 ගැටයකින් ආරම්භ කරනු ලබන මැස්මක් වන්නේ

i පිස්මේන්තු මැස්ම ii බොරු නූල් ඇදීම

iii ගැට පිස්මේන්තු මැස්ම iv වාටි මැස්ම

28 ළදරු ඇඳුමක තිබිය යුතු ලක්ෂණයක් නොවන්නේ

i සරල බව ii විවර රහිත බව

iii මූට්ටු අඩුබව iv කුඩා මෝස්තර සහිත බව

29 විසිතුරු මැහුම් ක්‍රමයක් මෙන්ම වාටි නිම කිරීම සඳහා ද යොදාගත හැකි මැහුම් ක්‍රමයකි.

i නැටි මැස්ම ii දිග කොට සැදීම iii කතිර මැස්ම iv බ්ලැන්කට් මැස්ම

30 මූලික මැහුම් ක්‍රම වන්නේ

i වාටි මැස්ම හා බ්ලැන්කට් මැස්ම

ii පිස්මේන් මැස්ම හා බ්ලැන්කට් මැස්ම

iii හීන්නූල් දිවවීම හා පිස්මේන් මැස්ම.

iv වාටි මැස්ම හා නැටි මැස්ම.

31 ළදරු ඇඳුමක් මැසීමේ නිවැරදි අනුපිළිවෙල වනුයේ

i උරහිස, විවරය, කර, අත්කට, වාටිය මැසීම
ii උරහිස, කර, අත්කට, විවරය, හා වාටිය මැසීම
iii උරහිස, අත්කට, විවරය, කර හා වාටිය මැසීම
iv උරහිස, කර, විවරය, අත්කට, හා වාටිය මැසීම

32 වෙල්කෝ ටේප් ඇල්ලීමට වඩා සුදුසු වන්නේ

i කුෂන් කවරයක කටය ii ළමා ගවුමකටය
iii ළදරු ඇඳුමකටය iv බන්දේසි කවරයකට

33 ගර්භණී භාවය සනාථ කෙරෙන සායනික පරීක්ෂණයක් වනුයේ

i මුත්‍රා පරීක්ෂාව ii රුධිර පීඩන පරීක්ෂාව
iii බර පරීක්ෂාව iv රුධිර පරීක්ෂාව

34 ශුක්‍රාණුවක් සමග ඩිම්භයක් සංසේචනය වනුයේ ප්‍රජනක පද්ධතියේ කුමන අවයවය තුළදී ද?

i ගර්භාෂයේදී ය. ii ඩිම්භ කෝෂයේදී ය.
iii යෝනි මාර්ගය තුළදී ය. iv පැලෝපීය නාලය තුළදී ය.

35 ගර්භණී සායනයකදී එක්වරක් පමණක් පරීක්ෂා කරණු ලබන්නේ

i මවගේ රුධිර පීඩනයයි ii මවගේ උසය
iii මවගේ බරය iv මවගේ මුත්‍රා පරීක්ෂාව

36 ගර්භණී අවධියේ බලපෑම් ඇති කළහැකි අවධානම් සාධකයක් වනුයේ

i මල බද්ධය ii වමනය
iii ග්‍යැස්ට්‍රයිටීස් iv අධි රුධිර පීඩනය

37 යොවුන්වියේ ගැහැණු දරුවන් පෙන්නුම් කරණු ලබන ද්විතියික ලිංගික ලක්ෂණයකි.

i උස හා බර වැඩිවීම ii උකුළ පළල්වීම
iii අත් හා පා දිගුවීම iv ශරීරයේ මේද පටක වර්ධනය

38 ගර්භණී භාවයේ ලක්ෂණයක් නොවන්නේ

i උදෑසන ඔක්කාරය i මාස් ශුද්ධිය නතරවීම
iii අත් පා ඉදිමීම iv නිතර මුත්‍රා පිටකිරීම

39 ඊස්ට්‍රජන් යනු

i ස්ත්‍රී ලිංගික හෝමෝනයකි
ii පුරුෂ ලිංගික හෝමෝනයකි
iii ළදරුවන්ගේ වර්ධන හෝමෝනයකි
iv යොවුන්වියේ හෝමෝනයකි.

40 කළලය අධිරෝපනය වීම සිදුවන්නේ ස්ත්‍රී ප්‍රජනක පද්ධතියට අයත් කුමන ඉන්ද්‍රිය තුළ ද

i ගර්භාෂය ii පැලෝපීය නාල
iii ඩිම්භකෝෂ iv යෝනි මාර්ගය